ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව - 2024

--

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 (1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2024 දෙසැම්බර් 31 දිනට ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන්, අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මෙම වාර්තාවේ 1.6 ඡේදයේ 1.6.2 (ඇ) නිරීක්ෂණය හැර, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභා පෙර පාසලේ සෙල්ලම් මිදුලේ උපකරණ සවි කිරීම වෙනුවෙන් දරන ලද රු.496,780 ක් නිවැරදිව ලී බඩු හා උපකරණ යටතේද, දෝෂ සහගත ලෙස ඉඩම් ගොඩනැගිලි යටතේද, දෙවරක් ගිණුම්ගත කර තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී නිවැරදි කරන බව.	ද්විගණන දෝෂ ඇති නොවන පරිදි නිවැරදි වර්ගීකරණය අනුව උපකරණ හා සවි කිරීම් ගිණුම්ගත කළ යුතුය.
(ආ)	ප්‍රාග්ධන වියදම් අයිතම් 04 ක් ප්‍රාග්ධනිත කිරීමේදී ඊට අදාල අනුෂාංගික වියදම් එකතුව රු.මිලියන 1.11 ක් ඇතුළත් කර නොතිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී නිවැරදි කරන බව.	මිලදී ගනු ලබන ජංගම නොවන වත්කම් නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු.411,213 ක් වැඩියෙන් දක්වා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබූ අතර එය සමාලෝචිත වර්ෂයේදී ද නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී නිවැරදි කරන බව.	සමුච්චිත අරමුදලේ ශේෂයේ වෙනස්වීමට අදාළ හේතු සොයා බලා මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් කළ යුතුය.

1.7 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571	වසර 02 ඉක්ම වූ රු. 98,000 ක ආරක්ෂිත ඇප තැන්පතු ශේෂ 04 ක් ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී සභා ආදායමට ගැනීමට කටයුතු කරන බව.	යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව වසර 02 ඉක්ම වූ සුදුසු තැන්පත් ශේෂ ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය	සභාවට අයත් ක්‍රියාකාරී තත්ත්වයේ පවතින වාහන 10 ක ඉන්ධන දහනය පරීක්ෂාව සිදුකර නොතිබුණි.	සියලුම වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරන බව.	චක්‍රලේඛයේ යොමුගත වගන්තිය ප්‍රකාරව වාහන වල ඉන්ධන දහන පරීක්ෂාව සිදු කළ යුතුය.
(ඇ)	2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරණ භාණ්ඩාගාර ලේකම්ගේ වත්කම් හා කළමනාකරණ චක්‍රලේඛය	ධාවනයෙන් ඉවත් කර තිබූ සභාව සතු වාහන හතරක් අපහරණය කිරීමට හෝ අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි.	ජලබවුසර 02 සහ කැබ් රථය අපහරණය සඳහා කටයුතු කරමින් පවතින බව.	ක්‍රියාකාරී තත්වයේ නොපවතින වාහන සම්බන්ධයෙන් යොමුගත චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඈ)	2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/ 2010/01 දරණ දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය	සභාව සතු වෙළඳ සංකීර්ණ 04 ක, කඩ කාමර 31 ක් නව තක්සේරුවක් ලබා ගැනීමට කටයුතු නොකර පැරණි තක්සේරුව මත පදනම්ව 2024 හා 2025 වර්ෂවල කුලී අය කිරීමට කටයුතු කර තිබුණි.	කඩකාමර 22 ක් සඳහා නව තක්සේරු වාර්තාව අනුව කුලී අය කිරීමේ කටයුතු සිදු කරන බවත්,ඉතිරි කඩකාමර 09 ට අදාල තක්සේරු වාර්තා ලැබී නොමැති බව.	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව සභාව සතු කඩ කාමර කාලීනව තක්සේරු කර කුලී අය කිරීමට කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.695,658 ක් වී තිබූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.මිලියන 3.82 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාවේ ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	2024				2023			
ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තුගත ආදායම	බිල් කළ ආදායම	රැස් කළ ආදායම*	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තුගත ආදායම	බිල් කළ ආදායම	රැස් කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
වරිපනම් හා බදු	850,000	875,100	928,577	73,683	1,054,000	709,120	736,720	127,160
කුලී	11,160,300	5,801,969	6,081,415	492,568	8,971,000	4,004,296	4,618,578	772,014
බලපත්‍ර ගාස්තු	2,500,600	1,889,605	2,572,695	180,400	1,685,700	1,833,050	2,364,900	863,490
වෙනත් ආදායම්	10,948,800	2,507,635	2,421,088	300,892	3,686,500	1,239,604	1,653,867	214,345
එකතුව	**25,459,700**	**11,074,309**	**12,003,775**	**1,047,543**	**15,397,200**	**7,786,070**	**9,374,065**	**1,977,009**

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට සියලු ආදායම් ප්‍රභවයන් ගෙන් මුළු හිඟ ආදායම රු.මිලියන 1.98 ක් වූ අතර, වර්ෂයේ මුළු බිල් කිරීම් රු.මිලියන 11.07 ක් විය. ඒ අනුව වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු.මිලියන 13.05ක් වුවද, කපාහරින ලද සහ රැස්කරන ලද ආදායම රු.මිලියන 12 ක් විය. එය සමස්ථ ආදායමෙන් සියයට 92 ක් වී තිබුණි.	2025 වර්ෂයේදී හිඟ ආදායම් කඩිනමින් රැස්කර ගැනීමට සහ අයකර ගත නොහැකි ආදායම් සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් කඩිනමින් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය.

2.2.3 දැන්වීම් පුවරු ගාස්තු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2023 නොවැම්බර් 03 දිනැති හා අංක 2357 දරණ ගැසට් පත්‍රයේ පලකරන ලද විධිවිධාන ප්‍රකාරව දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර තිබුණද, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභා බල ප්‍රදේශයේ මත්තල පාර හා නව නගර ආශ්‍රිත මාර්ගවල පමණක් ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු 35 ක් වෙනුවෙන් රු.255,500 ක ගාස්තු අයකර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ දැන්වීම් පුවරු ගාස්තු රු.180,400 ක් අයකර ගෙන නොතිබුණි.	2024 දෙසැම්බර් අග ප්‍රදර්ශනය කළ බවට තහවුරු වූ බැවින් 2025 වර්ෂයේදී අයකරගත යුතු අදායමක් ලෙස අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව.	දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීමට පෙර ගාස්තු අයකරගත යුතුය.

2.2.4 මුද්දර ගාස්තු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.මිලියන 5.80 ක් වූ අතර ලැබිය යුතු මුද්දර ගාස්තු ශේෂයෙහි 2023 වර්ෂයට අදාළව ලැබිය යුතු ශේෂය රු.මිලියන 2.24 ක් විය.	2003 වර්ෂයේ හිඟයෙන් රු.මිලියන 02 ක් අයකර ගෙන ඇති බව.	හිඟ ආදායම් කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභා බල ප්‍රදේශය තුළ පිහිටි මාර්ග අලුත්වැඩියාව හා විවිධ ආපදා තත්ත්වයන් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ ලද මහජන පැමිණිලි 23 ක් සහ 2023 වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාසවල ලද පැමිණිලි 12 ක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. වීථි පහන් අලුත්වැඩියා කිරීම් සම්බන්ධව ලද මහජන පැමිණිලි ලේඛනය අනුව ක්‍රියාමාර්ග ගෙන නොතිබූ පැමිණිලි 21 ක් වූ අතර එහි කාලපමාව දින 09 සිට දින 74 ක පරාසයක් ගෙන තිබුණි. මේ අනුව මහජනයාට ඉටුවිය යුතු සේවාව ඉටු වීමේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොපැවතුණි.	ක්ෂේත්‍ර පරීක්ෂාවන් කිරීමෙන් පසු ඉහළ ප්‍රමුඛතාවයක් සහිත කඩිනමින් අලුත්වැඩියා කළ යුතු මාර්ග හා විථි පහන් හඳුනාගෙන අලුත්වැඩියා කටයුතු සිදු කරන බව.	මහජන පැමිණිලි සම්බන්ධව කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය.

(ආ)	2022 ජනවාරි 27 දිනැති අංක 2264/18 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතට අදාළව I ඡේදයේ (ඇ) කොටසට අයත්වන කර්මාන්ත සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු වුවත්, සිදුකළ නියැදි විගණන පරීක්ෂාවට අනුව සභාවේ පරිසර ආරක්ෂණ බලපත්‍රය අලුත් නොකරන ලද ආයතන 03 ක් පැවති අතර එම ආයතන වලින් රු.13,200 ක් සභාවට අහිමි වී තිබුණි.	වඩු මඩුව සහ වී මෝල සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රය නිකුත් කර ඇති බව හා කොන්ක්‍රීට් වැඩපල සඳහා ද පරිසර බලපත්‍රය ලබා දීමට කඩිනමින් කටයුතු කරන බව.	ව්‍යාපාර ආයතන පරිසර බලපත්‍ර ලබාගැනීමට උනන්දු කර සභාවට අයවිය යුතු ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2013 දෙසැම්බර් 24 දින රු.40,000 ක මුදලකට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අංක H/01/777/2013 දරණ විවිධ අවසර පත්‍රයක් මගින් වර්ෂයක් සඳහා වූ කාලයකට හෙක්ටයාර් 4 ක් වූ ඉඩම ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ලබාදී තිබූ අතර, එහි පවරා ගැනීම් කටයුතු ආරම්භ කර තිබියදී, 2018 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාල සීමාවට අදාළව 2024 අගෝස්තු 14 දින රු.272,800 ක මුදලක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ගෙවා තිබීමේ අවශ්‍යතාවය විගණනයට පැහැදිලි නොවීය.	රු.272,000ක හිඟ බලපත්‍ර ගාස්තු ගෙවීමෙන් පසු පවරා දීම හෝ නිදහස් බලපත්‍රයක් නිකුත් කරන බව දිසා වන කාර්යාලය මගින් දැනුම් දී ඇති බව.	සභාව වෙත ඉඩම පැවරීමට අදාළ කටයුතු කිරීමේදී ගාස්තු ගෙවීමේ අවශ්‍යතාවය පැහැදිලි කළ යුතුය.
(ආ)	ඉටුකරන ලද කර්මාන්ත වලට අදාළව වැඩිපුර ගෙවන ලද මුදල්, සියයට 10 රඳවුම් මුදලින් අඩුකරගෙන විවිධ තැන්පතු යටතේ එකතු වටිනාකම රු.849,553 ක මුදලක් තැන්පත් කර තිබූ අතර එම මුදල් අදාළ කර්මාන්ත නැවත පරීක්ෂා කර නිවැරදි කිරීමට හෝ සභා ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.	ව්‍යාපෘතිවලට අදාළව අයවිය යුතු මුදල් අයකර ගත් පසු ඉතිරිය නිසි ක්‍රමවේදයක් යටතේ නිදහස් කිරීම හෝ සභා ආදායමට ගන්නා බව.	රඳවාගත් මුදල් අදාළ කර්මාන්ත වල දෝෂ නිවැරදි කිරීමට හෝ සභා ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය.

3.3 නිෂ්කාර්ය දේපල පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2019 වර්ෂයේ රු.මි. 18 ක් වැයකර රජයේ වියදමින් ඉදිකරන ලද දැනට ඵලදායි ආර්ථික කටයුත්තකට යොදාගෙන නොමැති ලුණුගම්වෙහෙර බස් නැවතුම්පොළ ගොඩනැගිල්ලෙහි බොජුන්හලක් පවත්වාගෙන යාම සඳහා ප්‍රාදේශීය සභාව වෙත පරිහරණ අයිතිය පැවරීමට අදාළව සභාව හා දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය අතර අවබෝධතා ගිවිසුමක් 2022 දෙසැම්බර් 29 දින අත්සන් කර තිබුණද, එම ගිවිසුම ක්‍රියාත්මක වන නිශ්චිත කාලයක් සඳහන් කර නොතිබූ අතර ගොඩනැගිල්ලේ විවිධ වියදම් වෙනුවෙන් රු.53,062 ක් සභාව විසින් දරා තිබුණද, 2025 ජනවාරි 08 දින විගණන අවස්ථාව වන විට වර්ෂ 03 ක් ගතවී පැවතුණද සභාව විසින් බස් නැවතුම්පොළෙහි බොජුන්හලක් පවත්වා ගෙන ගොස් නොතිබූ බැවින් අදාළ අරමුණු ඉටු කරගෙන නොතිබුණු බවත් රජයේ වියදමින් ඉදිකරන ලද ලුණුගම්වෙහෙර නව බස් නැවතුම්පොළ ඉදිකර වසර 07 ක් ඉක්මවා ගොස් තිබුණද එය අත්හැර දමා ඇති ගොඩනැගිල්ලක් පමණක් විය.	ගිවිසුම අවලංගු කර අදාල පාර්ශවයන් වෙත පවරා ගන්නා ලෙස කරන ලද ඉල්ලීමට අවශ්‍ය කටයුතු සිදු කර නොමැති බැවින් නිශ්චිත පිළිතුරක් ලැබෙන තෙක් ගොඩනැගිල්ල සඳහා නඩත්තු වියදම් දැරීමට සිදු වී ඇති බව .	ලුණුගම්වෙහෙර බස් නැවතුම් පල ගිවිසුම්ගත වූ පරිදි අදාළ අරමුණු වෙනුවෙන් යොදා ගැනීමට හෝ නැවත භාර දීමට කටයුතු කළ යුතුය.
(ආ)	දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2018 යටතේ ප්‍රජා ජල සැපයුම් ව්‍යාපෘතියක් මඟින් ජනතාවට ජලය බෙදාහැරීම හා වගාව සඳහා යොදා ගැනීමේ අරමුණින් ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව ඉදිරිපිට නළ ළිඳක් හා ආධාරකය සහිත ජල ටැංකියක් ඉදිකිරීම සඳහා රු.මිලියන 1.59 ක් වැයකර තිබුණද, අදාළ ව්‍යාපෘතිය වසර 02 කට පෙර සිට අක්‍රියව පවතින බවත්, රු.733,450 ක් වටිනා ජල මෝටරය භෞතිකව සභා පරිශ්‍රය තුළ නොමැති අතර ලීටර් 10,000 ධාරිතාවයක් සහිත ජල ටැංකිය පතුලේ කරාමය ළඟින් පුපුරා ගොස් ඇති බැවින් අදාළ ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.	අදාල ජල ව්‍යාපෘතිය නැවත සක්‍රීය මට්ටමට ලඟා කර ගැනීමට කටයුතු කරන බව සහ ජල මෝටරය අලුත්වැඩියා කිරීමට දුන් ආයතනයෙන් නැවත ගෙන්වා ගැනීමට කටයුතු කරන බව .	ප්‍රජා ජල ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද වියදම්වලින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගත යුතුය.

3.4 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව සතු වාහන 03 ක් සහ සභාව විසින් පරිහරණය කරනු ලබන අක්කර 161 රූඩ් 01 පර්චස් 33.70 ක් වූ ඉඩම් 107 ක් සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	වාහන 03 හි අයිතිය මෙතෙක් පවරා දී නොමැති බවත්, ඉඩම් පවරා ගැනීම් කටයුතු සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව.	සභාව සතු වාහන 03 ක සහ භුක්ති විඳින ඉඩම් 107 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට නිශ්චිත කාලසීමාවක් තුල සිදු කල යුතුය.

(ආ)	2007 මාර්තු 19 දිනැති හා අංක දපපා/15 දරණ දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් ලිපිය ප්‍රකාරව පළාත් පාලන ආයතන සතු සෑම දේපලකටම අනවසරයෙන් ඇතුළුවීමට නොහැකි වන සේ වැට මායිම් දැමීමට සහ ගැටළු සහගත තත්ත්වයේ ඇති ඉඩම් නැවත මැන නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතු වුවද, 2023 වර්ෂයේ ඉඩම් සමීක්ෂණ වාර්තාව අනුව සභාව විසින් එසේ කටයුතු කර නොතිබුණු අවස්ථා 71 ක් විය.	පොදු ඉඩම් ලැයිස්තුවේ සඳහන් ඉඩම් පවරා ගැනීම අදාල නීත්‍යානුකූල කටයුතු අවසන් වීමෙන් පසු වැට මායිම් සකස් කිරීමට කටයුතු කරන බව.	සභාව සතු ඉඩම් වැට මායිම් දමා ආරක්ෂා කරගත යුතුය.
(ඇ)	ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම්ගේ 2002 මැයි 24 දිනැති හා අංක ලු/ඉස/3/3/64 දරණ ලිපිය අනුව ආදාහනාගාරයක් ඉදිකිරීම සඳහා වීරවිල තුරුසෙවන ඉදිරිපිට පිහිටි අක්කර 08 ක පමණ ඉඩමෙන් අක්කර 02 ක් සභාවට පවරා දීමට කටයුතු කර තිබූ අතර ඒ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම් හෝ දැනට පවරාදීමේ මට්ටම පිළිබඳ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොවීය.	ඉඩමට අදාළව මායිම් පිළිබඳව ගැටළුවක් පවතින බැවින් ඒ සම්බන්ධව ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටුව වෙත යෝජනාවක් ලෙස ඉදිරිපත් කර ඇති බව.	සභාව සතු ඉඩම්වල අයිතිය සහ ආරක්ෂාව තහවුරු කරගත යුතුය.

3.5 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාවේ තනතුරු 05 කට අදාළව සේවකයින් 09 දෙනෙකුගේ අතිරික්තතාවයක් නිරීක්ෂණය විය.	ද්විතීය තනතුරු වලට අදාල අනුමත කිරීම් මේ අවස්ථාවේ සිදු කල නොහැකි බව පළාත් පාලන කොමසාරිස් දන්වා ඇති බව.	සභාවේ කාර්ය මණ්ඩල අවශ්‍යතාවය පිළිබඳ සමාලෝචනයක් සිදු කළ යුතුය.
(ආ)	2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව වසර 05 ක් ඉක්මවන එකම සේවා ස්ථානයේ සේවය කර ඇති සෑම නිලධාරියෙකුම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩදීම සඳහා ස්ථාන මාරු ලබාදිය යුතු වුවත්, සභාව තුළ සේවය කරනු ලබන නිලධාරීන් 08 දෙනෙකු වසර 06 සිට වසර 25 දක්වා වූ කාල පරිච්ඡේදයක් සභාව තුලම සේවය කරමින් සිටින බව නිරීක්ෂණය විය.	2025 වර්ෂයේ වාර්ෂික ස්ථානමාරු අයදුම්කර ඇති බව.	යොමු ගත චක්‍රලේඛය ප්‍රකාරව වසර 05 ඉක්මවා ඇති නිලධාරීන් වෙනත් සේවා සථානයන්ට මාරු කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාවේ ක්‍රියාකාරී සැලැස්ම මත පදනම් වූ ආයතනික කාර්යසාධන දර්ශක 15 ක් යටතේ වූ අනු දර්ශක 24 කින් දර්ශක 05 කට අදාළව තත්‍ය නිමවුම් ප්‍රතිශතය සියයට 50 ට වඩා අඩු මට්ටමක පැවතුණු අතර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව 2024 දෙසැම්බර් 31 දින වන විට ඇස්තමේන්තු මුදල රු.මිලියන 66.78 ක් වූ ව්‍යාපෘති 09 ක් සභාව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.	ඉදිරි වසර වලදී පහසුවෙන් ළඟා කර ගත හැකි දර්ශක පිළිබඳ වැඩි අවධානයක් යොමු කරන බව.	ඉලක්ක ගතව සංවර්ධන යෝජනා සැලසුම් කිරීමටත් ඒවා ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කළ යුතුය.

4.2 අයවැය පාලනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය සඳහා වූ ආදායම් විෂයයන් 05 ක අයවැයගත සහ තත්‍ය ආදායම් හා වියදම් අතර එකතුව රු.මිලියන 158.25 ක සැලකිය යුතු අහිතකර විචලනයක් නිරීක්ෂණය වූ අතර එය සියයට 24 සිට සියයට 91 දක්වා වූ පරාසයක වූයෙන් අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.	ඉදිරි වර්ෂයන් සඳහා අයවැය සකස් කිරීමේදී වඩාත් ඵලදායී ලෙස සකස් කිරීමට කටයුතු කරන බව.	විචලනයන් අවම කිරීමත්, සැලසුම්කරණය විධිමත් කර ගැනීමත්, ආදායම් රැස්කිරීම කාර්යක්ෂම කර ගැනීමත් සිදු කළ යුතුය.
(ආ)	සභාව විසින්, 2024 වර්ෂය සඳහා ප්‍රාග්ධන ලැබීම් ලෙස රු.මිලියන 162.83 ක් ඇස්තමේන්තුකර තිබුණද, එය තත්‍ය ලැබීම මෙන් 12 ගුණයක් විශාල වන අතර පූර්ව වසර 02 ක ඇස්තමේන්තුගත ලැබීම්වලට සාපේක්ෂව විශාල මුදලක් ඇස්තමේන්තුවට ඇතුළත් කර තිබීමෙන් අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට නොහැකි වීමට හේතුවක් වී ඇත.	ඉදිරි වර්ෂයන් සඳහා අයවැය සකස් කිරීමේදී වඩාත් ඵලදායී ලෙස සකස් කිරීමට කටයුතු කරන බව.	ඇස්තමේන්තු සකස් කිරීමේදී, අසාමාන්‍ය විචලනයන් අවම කරගත යුතුය.

4.3 පාරිසරික ගැටලු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානයේ කසළ කළමනාකරණය සඳහා ලබාගන්නා ලද පරිසර ආරක්ෂණ බලපත්‍රයේ කොන්දේසි අංක 03 අනුව ඝණ අපද්‍රව්‍යවල ඇති ප්ලාස්ටික්, පොලිතින්, කඩදාසි, වීදුරු සහ යකඩ වෙන් වෙන් වශයෙන් තෝරා ඒවා ප්‍රතිචක්‍රීකරණය සඳහා අදාළ ආයතන වෙත යොමුකළ යුතු අතර, එසේ යොමු කරනු ලබන තෙක් සුදුසු ස්ථානයක සුළඟට ගසාගෙන නොයන ලෙස හා වර්ෂා ජලයට එකතු නොවන සේ විධිමත්ව ගබඩා කර තැබිය යුතු වුවත්, සභාව එපරිදි කටයුතු කර නොතිබුණි. එසේම කොම්පෝස්ට් නිෂ්පාදන හා අලෙවි කටයුතු කිරීමේදී නිවැරදි අභ්‍යන්තර පාලන ක්‍රමයක් පවත්වා නොතිබුණි.	මධ්‍යස්ථානයෙ එක් රැස්වන කසළ වෙන් වෙන්ව ගබඩා කරන බව හා ඩෙංගු මර්ධන වැඩසටහනට සමගාමීව එකතු වන කසල ගබඩා කිරීමට ප්‍රමාණවත් ඉඩකඩ නොමැති බව.	ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙල ක් සකස් කළ යුතුය.

4.4 තිරසර සංවර්ධන අරමුණු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධන දර්ශක 03 කට අදාළ ඉලක්ක 04 ක ජයග්‍රහන දර්ශක ළඟාකර ගැනීමේ ප්‍රතිශතය සියයට 0.8 සිට සියයට 27 ක පරාසයක අඩු මට්ටමක පැවතුණි.	දර්ශක වල වර්ධනය ගණනය කර ඇත්තේ පෙර වර්ෂයට සාපේක්ෂව බව.	තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීම ආරම්භයේ සිට මේ දක්වා ප්‍රගතිය නිවැරදිව ඉදිරිපත් කළ යුතුය.